සන්නස
SANNASA



## රයින් ගඟ ළඟ

**තුෂාරි ප්‍රියංගිකා**

රයින් ගඟ ළඟ
බලන් ඇති ඔබ
කියා යන්නට
නො එන බැව් යළි
එ ගං අසබඩ නමුදු මඟ හැර
පියනගමි මම ඔබට පිටු පා

දරාගන්න ට බැරිම සිතුවිලි
බර කරන් ඇහිපියන් යට ඇති.
දරාගන්න ට බැරිම සිතුවිලි
බර කරන් ඇහිපියන් යට ඇති.

## වසන්තය ඇවිත්

**ආනන්ද ගුණතිලක හොපර්ස් ක්‍රොසිං**

ගනකම් ඇඳුම් දෙක තුන එක පිට අන්ද
අතපය හකුලුවා සිටි, සීතල හන්ද
අම්හිරි අලස කම පසෙකට කර රන්ද
වසන්තය ඇවිත්, මුව හසරැලි කැන්ද

නුපුරුදු නමුදු සීතල, අප පැමිණි රටේ
හිම වැහි පවා, විටෙකදි මෙහි කඩා වැටේ
නලයෙන් එන වතුර වාගෙයි, අයිස් කැටේ
ඇඟ පත කිලි පොලා දත් ඇදි එකට ගැටේ

ගෙය පිටුපස දෙසට හෝ මිදුලට යන්න
වල් පැලයක් දෙකක් හෙම්හිට ගල වන්න
මල් පැලයක තියෙන හැඩ වැඩ දැක ගන්න
කාටද හැකි උනේ ඒවට හිත දෙන්න

සීතල මාස තුන හෙම්හිට ඉවර කරන්
ඇවිදින් වසන්තය නැවතත් හැමට හොරෙන්
ගස් වැල් තිබුන කොල ගැලවී ඉපල් ලෙසින්
පොඩි පොඩි ලපලු මතු කෙරුවා රිකිලි අගින්

මද නල හමයි අතු සහ දලු කිති කව මින්
විහඟුන් ගී ගයති, නට නට තටු සල මින්
හිරු නැඟ ඒවි කලු ගණ'කුළු මඟ හරි මින්
වට පිට කල එලියි, හදවත් තුටු කර මින්

ලස්සන මල් පිපෙන හැටි දැන් දැකිය හැකී
ඒ මල් වලින් පරිසරයම එලිය දකී
විහඟුන් බිඟුන් මුමුණන හඬ සවනෙ වැකී
හැඟුමන් ගෙනේ දහසක් කවි ලිවිය හැකී

## අහිමි සෙනෙහස

**ආනන්ද ගුණතිලක හොපර්ස් ක්‍රොසිං**

ගිලී නැහැවුනෙමි ඔබගේ සෙනෙහෙ   ගඟේ
ඔබ හැර නෙතට වෙන දසුනක් නොවිය   අගේ
ඈතට ගියා ඔබ දසුනින් මිදී   මගේ
අතරමං වුනෙමි ජීවන ගමන්   මගේ

ඔබ ගෙන ආ සතුට නැත අමතක   වන්නේ
තවමත් එය පතා හදවත   වැලපෙන්නේ
ඔබ අහිමිව ගිය දුකයි හද ගිනි   අවුලන්නේ
සැනසුම් කොහිද නැත මා තවමත්   දන්නේ

අප තැනු අහස් මාලිග බිම වැටී   ඇතේ
එහි සුන්බුන් පමණි අද ඉතිරිව   ඇත්තේ
සැකයක් නොමැත යලි එය ගොඩනැගෙනු   නැතේ
ආදරයේ සුවඳ වුව එ මත   නැත්තේ

හදවත දවන දුක කඳුලිනි   පිටවුයේ
ඒ කඳුලින් නොමැත ඔබේ හද උණු   වුයේ
විසඳිය නොහැකි පැනයකි සිත   මතුවුයේ
මෙලසින් වෙන්වෙන්න ඇයි අප   හමුවුයේ

## අපි ආයෙ හමුවෙයිද?

**වර්ණා රසිකා ගුණවර්ධන**

ඇබිත්තක් ඉතිරිවී ඇත
කිව යුතු හා ඇසිය යුතු.
කාලය මඳක් මදිවිය
විය යමක් ආපසු ගත යුතු.

පුෂ්ප හට නොගනු ඇත
ඉල්ලා සිටියද ඉති අතු .
කරුවල වැටෙණු නියතය
ආදරේ සිහිනයට මින් මතු.

දබරැඟිල්ලෙන් තට්ටු කර
දෙතොල් මුද්‍රා තැබූ පසු
අමතක වීම ශෝකයකි
නොදුන් හාදුවක දුක් තතු.



## පියවරුන් ගේ දිනය

**ජයසේන කොඩිතුවක්කු**

පරදා  සියළු බාධක දරු පෙම හමුවේ
නිබඳා  කැප වුනේ ගත සිත නොවිඳ සුවේ
සැමදා ඔබයි විරු සමරන අපේ ලොවේ
කවදා  නමුත් පිය ගුණ සමරනු  යුතු වේ

පපුවේ   තද කරන් සෙනෙහස නො අඩුවම
සිතුවේ  අපේ ලොව  ඉදි වන්නේ කොහොම
පැතුවේ  ඔබ නොලද සැප සම්පත් දීම
දිනුවේ   ඔබ නිසයි අද අප හැම දේම

කුස  ගිනි නිවන්නට ලේ කිරි නොකළාට
දස   දුක්  වින්දෙ කුඹුරේ බත සදන්නට
තුන්  වේලටම බඩ කට අපෙ පිරෙව්වට
එක   දවසක් මොටද ඔබෙ ගුණ ගයන්නට

ඔබෙ පුතු වෙන්න පෙර පිං කර තිබුනාට
යළි හමු වීම සසරේ හැකි වෙද අපිට
කළ සහ කරන හැම  පිං පවරා ඔබට
පතනෙමි පිය තුමනි මතු ඔබ බුදු වෙන්ට

## වෑයම

**එරංගා පෙරේරා**

යන්නමයි
වැර වෑයම
මද සුළඟටත්
ඈතටම ගසාගෙන

ඉතින් කොහොමද
සුළි සුළඟක්
ආවොතින්

දෑතක් ඇතිවෙයිද
නික්මී නොගොස්
වෑයමින්
නැවතෙන්න

## ජීවිතය දකිමු.

**ජයසේන කොඩිතුවක්කු**

ජීවිතයෙන් බිඳක්
විඳිනව ටික දොහක්
දැනුනට මහ කලක්
නැහැ ගත යුතු දෙයක්

මිනිසත් බවයෙක
මහිමයෙනි පෙර පිනක
ඒ බව වත් නොදැක
කරන විගඩම් කොතෙක

පැතුම් මහ සයුරකි
ලබන්නේ ඉන් බිඳකි
නොලද හැම දුකකි
එය සොබා දහමෙකි

ලද දෙයින් සැනසෙමු
නොලද දේ ගැන නොසිතමු
සැප දුක පිළිගනිමු
තතු ඇති ලෙසට දකිමු

සිතින් සිත දකිමු
සිතට වහලෙක් නොවෙමු
වැනසෙන දේට නොබැඳෙමු
සසර  කතරේ ඉමක් දකිමු

# පළහන් වැට